# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2304/17 - 2022 නොවැම්බර් මස 01 වැනි අඟහරුවාදා - 2022.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද රාජ්‍ය අමාත්‍යවරුන් වෙත විෂයයන් සහ කාර්යයන් පැවරීම වහාම ක්‍රියාත්මකවන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 26 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

**උපලේඛනය (I)**

1. **ගරු නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය, තේනුක විදානගමගේ මැතිතුමා**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ආයතන* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
| 1. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය වරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන හා නිවාස විෂයන්ට සහ II වැනි තීරුවෙහි | 1. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය<br>2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය) | ■ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත (1978 අංක 41)<br>■ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11) |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ආයතන* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
| දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 3. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | ■ බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (2018 අංක 23) |
| 2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම | 4. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | ■ බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4) |
| 3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම | 5. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | ■ පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10) |
| 4. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය | 6. ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | ■ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17) |
| 5. මධ්‍යම පන්තිකයින්ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ණය පහසුකම් සැලසීම | | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 6. කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රම හඳුන්වාදීම | | |
| 7. නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායී මිල යටතේ ඉඩම් ලබාදීම මගින් නව නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජකයන් දිරිමත් කිරීම | | |
| 8. සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු | | |
| 9. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම් ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 10. උචිත තාක්ෂණය උපයෝගීකර ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 11. ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් කටයුතු | | |

**උපලේඛනය (II)**

**2. ගරු නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය, අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ආයතන* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
| 1. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය වරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන හා නිවාස විෂයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | 1. සෙලෙන්දිව ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | ■ නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2) |
| 2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම | 2. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (PQ 143) | ■ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33) |
| 3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම | 3. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ■ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත (2008 අංක 35) |
| 4. මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය | 4. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව | ■ වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57) |
| 5. නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජයීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු | 5. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 6. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය | 6. සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය | |
| 7. මධ්‍යම පන්තිකයින්ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ණය පහසුකම් සැලසීම | 7. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | |
| 8. කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රම හඳුන්වා දීම | 8. අරුවක්කාලු කසල ව්‍යාපෘතිය | |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ආයතන* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
| 9. නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායී මිල යටතේ ඉඩම් ලබා දීම මගින් නව නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජකයින් දිරිමත් කිරීම | | |
| 10. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | |
| 11. වගකීම් රහිත කසල බැහැර කිරීම් වැළැක්වීමට පියවර ගැනීම | | |
| 12. සියලුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූලව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම | | |
| 13. රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම | | |
| 14. අදාළ නීති රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය | | |
| 15. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම | | |
| 16. බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව | | |
| 17. දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම | | |
| 18. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම හා ආරක්ෂාව සැලසීම | | |
| 19. සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු | | |
| 20. සමුද්‍ර සහ සමුද්‍ර ආශ්‍රිත දූෂණ නිවාරණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 21. වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය | | |
| 22. අපද්‍රව්‍ය බැහැරකිරීම් හේතුවෙන් මුහුදු තීරයට හා මුහුදු පතුලට සිදුවී ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුද්‍රුරු පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |

EOG 11 - 0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.